# පඤ්චමො පාඨො

# මහානිදාඝො

ජම්බුදීපස්මිං කිර පුබ්බෙ මහානිදාඝො අහොසි. තදා නිදාඝසූරියෙන සකිරණකරා වාපිපොක්ඛරණීනදීගිරිකන්දරනිජ්ඣරාදීසු උදකං නිස්සෙසං කත්වා පීතම්ව උදකෙ පරික්ඛීණෙ මච්ඡකච්ඡපාදයො යෙභුය්‍යෙන විනාසං පත්තා. අථ මහාරඤ්ඤභූමියං රුක්ඛතිණලතාදයො අතීව මිලාතා අහෙසුං. මිගපක්ඛිණො'පි සම්මාභිතත්තා පිපාසිතා මරීචිං තොයන්ති මඤ්ඤමානා ඉතොචිතො ච ධාවන්තා මහාදුක්ඛප්පත්තා අහෙසුං.

**(රසවාහිනී, ජම්බුදීපුප්පත්තිකථා)**

පදමාලාව

| | | | |
|---|---|---|---|
| **පුබ්බෙ** | **(ස.නා)** | - | පෙර |
| **මහානිදාඝො** | **(ස)** | - | මහ නියගයක් |
| **නිදාඝසූරියෙන** | **(ස)** | - | ග්‍රීෂ්ම සූර්යයා කරණ කොට |
| **සකිරණකරා** | **(ස)** | - | තම රශ්මියෙන් |
| **පොක්ඛරණී** | **(නා)** | - | පොකුණ |
| **ගිරිකන්දර** | **(ස)** | - | ගිරිකඳුරු |
| **නිජ්ඣර** | **(නා)** | - | දිය ඇලි |
| **නිස්සෙසං කත්වා** | **(පූ.ක්‍රි)** | - | ඉතිරි නො කොට |
| **පීතම්ව** | **(සං)** | - | පානය කළා සේ |
| **පරික්ඛීණෙ** | **(ක්‍රි)** | - | ක්ෂය වූ කල්හි |
| **මච්ඡ** | **(නා)** | - | මත්ස්‍ය |
| **කච්ඡප** | **(නා)** | - | කැසුබු/ඉදිබු |
| **යෙභුය්‍යෙන** | **(නි)** | - | බොහෝ සෙයින් |
| **පත්තා** | **(ක්‍රි)** | - | පැමිණියාහු |
| **සම්මාභිතත්තා** | **(ක්‍රි)** | - | ග්‍රීෂ්මයෙන් තැවුණෝ |
| **මරීචිං** | **(නා)** | - | මිරිඟුව |

| | | | |
|---|---|---|---|
| **තොයන්ති** | (සං) | - | ජලය යැයි |
| **මඤ්ඤමානා** | (කි) | - | සිතන්නාහු |
| **ඉතොවිතො** | (නි) | - | එහෙමෙහෙ/ ඔබිනොබ |
| **දුක්ඛපත්තා** | (සං) | - | දුකට පැමිණියාහු |
| **අහෙසුං** | (ක්‍රි) | - | වූහ |

**අභ්‍යාස**

1. 'මහානිදාඝො' ඡේදය සිංහලට නගන්න.
2. ඡේදය ආශ්‍රයෙන් පහත දැක්වෙන ප්‍රශ්නවලට පාලියෙන් පිළිතුරු සපයන්න.

i. පුබ්බෙ ජම්බුදීපෙ කිං අහොසි?
ii. නිදාඝසූරියෙන කෙසු ජලං පීතං?
iii. උදකෙ පරික්ඛීණෙ කෙ විනාසං පත්තා අභවිංසු?
iv. සම්මාහිතත්තා කෙ මරීචිං තොයන්ති චින්තෙසුං?
v. කෙ මිලාතා අහෙසුං?
vi. කිං ඣං මරීචිං දිට්ඨපුබ්බො?
vii. කෙ මහාදුක්ඛපත්තා අහෙසුං?
viii. කෙසු ජලං පරික්ඛීණං?
ix. සූරියෙන කෙහි ජලං පීතං?
x. කෙ ඉතොවිතො ධාවිංසු?

## ආඛ්‍යාත විභක්ති I

පාලි භාෂාවේ ආඛ්‍යාත විභක්ති අටකි. **වත්තමානා, පඤ්චමී, සත්තමී, පරොක්ඛා, හීයත්තනී, අජ්ජතනී, භවිස්සන්ති, කාලාතිපත්ති** යනු ඒ ආඛ්‍යාත විභක්තීන් ය. ඔබ පසුගිය වසරවල **වත්තමානා, භවිස්සන්ති, අජ්ජතනී** හා **පඤ්චමී** යන ආඛ්‍යාත උගෙන ඇත. එහි දී ආඛ්‍යාත පදයක කාල භේදය, පුරුෂ භේදය, වචන භේදය, ආඛ්‍යාත විභක්තීන්හි අර්ථ හා ආඛ්‍යාත පදවල අර්ථ ද පැහැදිලි කර ගන්නට ඇතැයි සිතමු. මෙම පාඩමේ දී ඔබ උගත් කාලත්‍රයට අයත් ක්‍රියා වරනැගීම පිළිබඳ නැවත සිහිපත් කෙරේ.

### වත්තමානා ආඛ්‍යාතය

ආරම්භ වී නිම නො වුණු කාලය වර්තමාන කාලය යි. **(වත්තමානා පච්චුප්පන්නෙ) ති, අන්ති, සි, ථ, මි, ම** යන ප්‍රත්‍යය වත්තමානා පරස්සපදයේ ද **තෙ, අන්තෙ, සෙ, ව්හෙ, එ, මෙහ** යන ප්‍රත්‍යය වත්තමානා අත්තනොපදයේ ද යෙදේ. √**පච** ධාතුව වර්තමානකාල ප්‍රත්‍යයන් සමග යෙදී වරනැගෙන අන්දම බලන්න.

**වත්තමානා පරස්සපද**

| පුරුෂය | ඒකවචන | | | බහුවචන | | |
|---|---|---|---|---|---|---|
| | සර්වනාම | ප්‍රත්‍යය | පදය | සර්වනාම | ප්‍රත්‍යය | පදය |
| පඨමපුරිස | සො | ති | පචති | තෙ | අන්ති | පචන්ති |
| මජ්ඣිමපුරිස | ත්වං | සි | පචසි | තුම්හෙ | ථ | පචථ |
| උත්තමපුරිස | අහං | මි | පචාමි | මයං | ම | පචාම |

| පුරුෂය | ඒකවචන | බහුවචන |
|---|---|---|
| පඨමපුරිස | පිසයි | පිසති/පිසත් |
| මජ්ඣිමපුරිස | පිසහි | පිසහු |
| උත්තමපුරිස | පිසමි | පිසමු |

**වත්තමානා අත්තනොපද**

| පුරුෂය | ඒකවචන | | | බහුවචන | | |
|---|---|---|---|---|---|---|
| | සර්වනාම | ප්‍රත්‍යය | පදය | සර්වනාම | ප්‍රත්‍යය | පදය |
| පඨමපුරිස | සො | තෙ | පචතෙ | තෙ | අන්තෙ | පචන්තෙ |
| මජ්ඣිමපුරිස | ත්වං | සෙ | පචසෙ | තුම්හෙ | ව්හෙ | පචව්හෙ |
| උත්තමපුරිස | අහං | ඒ | පචෙ | මයං | ම්හෙ | පචාම්හෙ |

පහත දැක්වෙන වගු හොඳින් අධ්‍යයනය කරන්න.

**වත්තමානා පරස්සපද**

| පඨමපුරිස | | මජ්ඣිමපුරිස | | උත්තමපුරිස | |
|---|---|---|---|---|---|
| ඒකවචන | බහුවචන | ඒකවචන | බහුවචන | ඒකවචන | බහුවචන |
| තිට්ඨති | තිට්ඨන්ති | තිට්ඨසි | තිට්ඨථ | තිට්ඨාමි | තිට්ඨාම |
| සයති | සයන්ති | සයසි | සයථ | සයාමි | සයාම |
| ඛාදති | ඛාදන්ති | ඛාදසි | ඛාදථ | ඛාදාමි | ඛාදාම |
| චරති | චරන්ති | චරසි | චරථ | චරාමි | චරාම |

### වත්තමානා අත්තනොපද

| පඨමපුරිස | | මජ්ඣිමපුරිස | | උත්තමපුරිස | |
|---|---|---|---|---|---|
| එකවචන | බහුවචන | එකවචන | බහුවචන | එකවචන | බහුවචන |
| තිට්ඨතෙ | තිට්ඨන්තෙ | තිට්ඨසෙ | තිට්ඨව්හෙ | තිට්ඨෙ | තිට්ඨාමෙහ |
| සයතෙ | සයන්තෙ | සයසෙ | සයව්හෙ | සයෙ | සයාමෙහ |
| ඛාදතෙ | ඛාදන්තෙ | ඛාදසෙ | ඛාදව්හෙ | ඛාදෙ | ඛාදාමෙහ |
| චරතෙ | චරන්තෙ | චරසෙ | චරව්හෙ | චරෙ | චරාමෙහ |

**භවිස්සන්ති ආඛ්‍යාතය**

අනාගත කාල ක්‍රියා සිද්ධියක් භවිස්සන්ති ආඛ්‍යාතයෙන් පැවසේ. **(අනාගතෙ භවිස්සන්ති) ස්සති, ස්සන්ති, ස්සසි, ස්සථ, ස්සාමි, ස්සාම** යන ප්‍රත්‍යය පරස්සපදයේත් **ස්සතෙ, ස්සන්තෙ, ස්සසෙ, ස්සව්හෙ, ස්සං, ස්සාමෙහ** යන ප්‍රත්‍යය අත්තනො පදයේත් යෙදේ. වත්තමානා ආඛ්‍යාත ප්‍රත්‍යයවලට '**ස්ස**' ප්‍රත්‍යය එකතු කළ විට භවිස්සන්ති ආඛ්‍යාත ප්‍රත්‍යය සාදාගත හැකි ය.

| වත්තමානා | භවිස්සන්ති |
|---|---|
| පච + ති = පචති | පච + ස්ස + ති = පචිස්සති |
| පච + න්ති = පචන්ති | පච + ස්ස + අන්ති = පචිස්සන්ති |
| පච + සි = පචසි | පච + ස්ස + සි = පචිස්සසි |
| පච + ථ = පචථ | පච + ස්ස + ථ = පචිස්සථ |

### භවිස්සන්ති පරස්සපද

| පුරුෂය | ඒකවචන | | | බහුවචන | | |
|---|---|---|---|---|---|---|
| | සර්වනාම | ප්‍රත්‍යය | පදය | සර්වනාම | ප්‍රත්‍යය | පදය |
| පඨමපුරිස | සො | ස්සති | පචිස්සති | තෙ | ස්සන්ති | පචිස්සන්ති |
| මජ්ඣිමපුරිස | ත්වං | ස්සසි | පචිස්සසි | තුම්හෙ | ස්සථ | පචිස්සථ |
| උත්තමපුරිස | අහං | ස්සාමි | පචිස්සාමි | මයං | ස්සාම | පචිස්සාම |

| පුරුෂය | ඒකවචන | බහුවචන |
|---|---|---|
| පඨමපුරිස | පිසන්නේය | පිසන්නෝය/පිසන්නාහ/ පිසන්නාහුය |
| මජ්ඣිමපුරිස | පිසන්නෙහි | පිසන්නෙහු |
| උත්තමපුරිස | පිසන්නෙමි | පිසන්නෙමු |

### භවිස්සන්ති අත්තනෝපද

| පුරුෂය | ඒකවචන | | | බහුවචන | | |
|---|---|---|---|---|---|---|
| | සර්වනාම | ප්‍රත්‍යය | පදය | සර්වනාම | ප්‍රත්‍යය | පදය |
| පඨමපුරිස | සෝ | ස්සතේ | පචිස්සතේ | තේ | ස්සන්තේ | පචිස්සන්තේ |
| මජ්ඣිමපුරිස | ත්වං | ස්සසේ | පචිස්සසේ | තුම්හේ | ස්සව්හේ | පචිස්සව්හේ |
| උත්තමපුරිස | අහං | ස්සං | පචිස්සං | මයං | ස්සාම්හේ | පචිස්සාම්හේ |

පහත වගු හොඳින් අධ්‍යයනය කරන්න.

### භවිස්සන්ති පරස්සපද

| පඨමපුරිස | | මජ්ඣිමපුරිස | | උත්තමපුරිස | |
|---|---|---|---|---|---|
| එකවචන | බහුවචන | එකවචන | බහුවචන | එකවචන | බහුවචන |
| පස්සිස්සති | පස්සිස්සන්ති | පස්සිස්සසි | පස්සිස්සථ | පස්සිස්සාමි | පස්සිස්සාම |
| යාචිස්සති | යාචිස්සන්ති | යාචිස්සසි | යාචිස්සථ | යාචිස්සාමි | යාචිස්සාම |
| භණිස්සති | භණිස්සන්ති | භණිස්සසි | භණිස්සථ | භණිස්සාමි | භණිස්සාම |
| ලිඛිස්සති | ලිඛිස්සන්ති | ලිඛිස්සසි | ලිඛිස්සථ | ලිඛිස්සාමි | ලිඛිස්සාම |

### භවිස්සන්ති අත්තනෝපද

| පඨමපුරිස | | මජ්ඣිමපුරිස | | උත්තමපුරිස | |
|---|---|---|---|---|---|
| එකවචන | බහුවචන | එකවචන | බහුවචන | එකවචන | බහුවචන |
| පස්සිස්සතේ | පස්සිස්සන්තේ | පස්සිස්සසේ | පස්සිස්සව්හේ | පස්සිස්සං | පස්සිස්සාම්හේ |
| යාචිස්සතේ | යාචිස්සන්තේ | යාචිස්සසේ | යාචිස්සව්හේ | යාචිස්සං | යාචිස්සාම්හේ |
| භණිස්සතේ | භණිස්සන්තේ | භණිස්සසේ | භණිස්සව්හේ | භණිස්සං | භණිස්සාම්හේ |
| ලිඛිස්සතේ | ලිඛිස්සන්තේ | ලිඛිස්සසේ | ලිඛිස්සව්හේ | ලිඛිස්සං | ලිඛිස්සාම්හේ |

**අජ්ජතනී ආඛ්‍යාතය**

අද පටන් ආසන්න අතීතකාල ක්‍රියා සිද්ධියක් **අජ්ජතනී ආඛ්‍යාත** විභක්තියෙන් පැවසේ. **(සමීපෙජ්ජතනී, අජ්ජප්පභුති සමීපෙ අතීතෙ කාලෙ අජ්ජතනී හොති)** අජ්ජතනී ආඛ්‍යාතයේ අකාරාගමය වූ රූප කොටසක් ද අකාරාගමය නො වූ රූප කොටසක් ද දැකිය හැකි ය. **ඊ, උං, ඔ, ත්ථ, ඉං, මှා** යන ප්‍රත්‍යය පරස්සපදයේත් **ආ, ඌ, සෙ, ව්හං, අ, මෙහ** යන ප්‍රත්‍යය අත්තනොපදයේත් යෙදේ.

**අජ්ජතනී පරස්සපද**

| පුරුෂය | ඒකවචන | | | බහුවචන | | |
|---|---|---|---|---|---|---|
| | සර්වනාම | ප්‍රත්‍යය | පදය | සර්වනාම | ප්‍රත්‍යය | පදය |
| පඨමපුරිස | සො | ඊ (ඉ) | අපචි, පචි<br>අපචී, පචී | තෙ | උං (ඉංසු) | අපචුං, පචුං<br>අපචිංසු,<br>පචිංසු |
| මජ්ඣිමපුරිස | ත්වං | ඔ | අපචො<br>පචො | තුම්හෙ | ත්ථ | අපචිත්ථ,<br>පචිත්ථ |
| උත්තමපුරිස | අහං | ඉං | අපචිං<br>පචිං | මයං | මහ (මහා) | අපචිමහ,<br>පචිමහ<br>අපචිමහා,<br>පචිමහා |

| පුරුෂය | ඒකවචන | බහුවචන |
|---|---|---|
| පඨමපුරිස | පිසුවේය | පිසුවෝය/ පිසූහ |
| මජ්ඣිමපුරිස | පිසුවෙහි | පිසුවෙහු |
| උත්තමපුරිස | පිසුවෙමි | පිසුවෙමු |

**අජ්ජතනී අත්තනොපද**

| පුරුෂය | ඒකවචන | | | බහුවචන | | |
|---|---|---|---|---|---|---|
| | සර්වනාම | ප්‍රත්‍යය | පදය | සර්වනාම | ප්‍රත්‍යය | පදය |
| පඨමපුරිස | සො | ආ | අපචා, පචා | තෙ | ඌ | අපචූ, පචූ |
| මජ්ඣිමපුරිස | ත්වං | සෙ | අපචිසෙ,<br>පචිසෙ | තුම්හෙ | ව්හං | අපචිව්හං,<br>පචිව්හං |
| උත්තමපුරිස | අහං | අ | අපච, පච | මයං | මෙහ | අපචිමෙහ,<br>පචිමෙහ |

පහත දැක්වෙන වගු අධ්‍යයනය කරන්න.

**අජ්ජතනී පරස්සපද**

| පඨමපුරිස | | මජ්ඣිමපුරිස | | උත්තමපුරිස | |
|---|---|---|---|---|---|
| එකවචන | බහුවචන | එකවචන | බහුවචන | එකවචන | බහුවචන |
| අදදි, දදි<br>අදදී, දදී | අදදුං, දදුං<br>අදදිංසු,<br>දදිංසු | අදදො,<br>දදො | අදදිත්ථ,<br>දදිත්ථ | අදදිං, දදිං | අදදිම්හ, දදිම්හ<br>අදදිම්හා,<br>දදිම්හා |
| අකිණි, කිණි<br>අකිණී, කිණී, | අකිණුං,<br>කිණුං<br>අකිණිංසු,<br>කිණිංසු | අකිණො,<br>කිණො | අකිණිත්ථ,<br>කිණිත්ථ | අකිණිං,<br>කිණිං | අකිණිම්හ,<br>කිණිම්හ<br>අකිණිම්හා,<br>කිණිම්හා |
| අභවි, භවි<br>අභවී, භවී | අභවුං, භවුං<br>අභවිංසු,<br>භවිංසු | අභවො,<br>භවො | අභවිත්ථ<br>භවිත්ථ | අභවිං, භවිං | අභවිම්හ,<br>භවිම්හ<br>අභවිම්හා,<br>භවිම්හා |

**අජ්ජතනී අත්තනොපද**

| පඨමපුරිස | | මජ්ඣිමපුරිස | | උත්තමපුරිස | |
|---|---|---|---|---|---|
| එකවචන | බහුවචන | එකවචන | බහුවචන | එකවචන | බහුවචන |
| අදදා, දදා | අදදූ, දදූ | අදදිසෙ,<br>දදිසෙ | අදදිව්හං,<br>දදිව්හං | අදද, දද | අදදිම්හෙ,<br>දදිම්හෙ |
| අකිණා,<br>කිණා | අකිණූ, කිණූ | අකිණිසෙ,<br>කිණිසෙ | අකිණිව්හං,<br>කිණිව්හං | අකිණ,<br>කිණ | අකිණිම්හෙ,<br>කිණිම්හෙ |
| අභවා, භවා | අභවූ, භවූ | අභවිසෙ,<br>භවිසෙ | අභවිව්හං,<br>භවිව්හං | අභව, භව | අභවිම්හෙ,<br>භවිම්හෙ |

- අජ්ජතනී ආඛ්‍යාත විභක්ති ප්‍රත්‍යය චුරාදි ගණයට අයත් ධාතු සමග යෙදෙන විට ඉහත දක්වන ලද ක්‍රමයට වඩා වෙනස් ලෙස වරනැගේ.

| පුරුෂය | එකවචන | බහුවචන |
|---|---|---|
| **පඨමපුරිස** | චොරෙසි, චොරයී | චොරෙසුං, චොරයිංසු |
| **මජ්ඣිමපුරිස** | චොරයො | චොරයිත්ථ |
| **උත්තමපුරිස** | චොරයිං | චොරයිම්හා |

ඉහත ක්‍රමයට සමාන ව වරනැගෙන තවත් ක්‍රියාපද කීපයක්:-

**ආනෙසි** - ගෙනාවේය
**ජාලෙසි** - දැල්වීය
**චින්තෙසි** - සිතුවේය
**නෙසි** - ගෙනාවේය/පැමිණවීය
**දෙසෙසි** - දේශනා කළේය
**පූජෙසි** - පිදුවේය
**ඨපෙසි** - තැබුවේය
**කථෙසි** - කීවේය
**මාරෙසි** - මැරුවේය
**පීළෙසි** - පෙළුවේය

**අභ්‍යාස**

1. පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. ආඛ්‍යාත විභක්ති අට නම් කරන්න.
ii. වත්තමානා, භවිස්සන්ති, අජ්ජතනී යන ආඛ්‍යාතයන්ට අදාළ බාලාවතාර සූත්‍ර පාඨ ලියා දක්වන්න.
iii. වත්තමානා, භවිස්සන්ති, අජ්ජතනී යන ආඛ්‍යාත විභක්ති ප්‍රත්‍යය වෙන වෙන ම වගුගත කර දක්වන්න.
iv. √ගමු = (ගචඡ) ධාතුව කාලත්‍රයේ උභයපදයේ වරනගා එහි තේරුම ද ලියා දක්වන්න.

2. පහත දැක්වෙන වගුව සම්පූර්ණ කරන්න.

| ආඛ්‍යාත පදය | ආඛ්‍යාත විභක්තිය | පුරුෂය | වචනය |
|---|---|---|---|
| පතිංසු | | | |
| ආහිණ්ඩන්ති | | | |
| ජීන්දිස්සන්ති | | | |
| ගමිස්සාමි | | | |
| ආරුහිං | | | |

3. පහත දැක්වෙන වාක්‍ය සිංහලට නගන්න.

i. අම්හාකං පිතරො මධුං ආහරිත්වා දධිනා සහ භුඤ්ජිංසු.
ii. මයං තුම්හෙහි විනා අරඤ්ඤං ගන්ත්වා දාරූනි භඤ්ජිස්සාම.
iii. දාරකො ඡත්තං ගණ්හිතුං සොපාණං ආරුහති.
iv. මයං ලොචනෙහි රූපානි පස්සිත්වා සුඛං ච දුක්ඛං ච ලභාම.
v. දෙවා වසුධායං මනුස්සෙ රක්ඛන්ති.

4. පහත සඳහන් වාක්‍ය පාලියට නගන්න.

i. බුදුරජ භික්ෂූන්ට ධර්මය දේශනා කළ සේක.
ii. පෙර ලංකාවේ දප්පුල නම් රජෙක් වීය.
iii. ඔවුහු ඊයේ උදෑසන ම කුඹුරට ගියහ.
iv. අපගේ මච්චරු දිනපතා බත් පිසති.
v. අපි විහාරයට ගොස් බුදුරදුන්ට මල් පූජා කළෙමු.